# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## භාර ලදුපත් (සංශෝධන)

**(86 වන අධිකාරය වූ) භාර ලදුපත් ආඥාපනත සංශෝධනය**
**කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින්
2024 ජනවාරි මස 09 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 නොවැම්බර් මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[228 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය*: මෙම වගන්තිය මගින් (86 වන අධිකාරය වූ) භාර ලදුපත් ආඥාපනතේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ නොව 2024 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කරනු ලබන භාර ලදුපත්වල නෛතික ප්‍රතිඵල පිළිබඳව විධිවිධාන සැලැස්වීම වේ.

*3 වන වගන්තිය*: මෙම වගන්තිය මගින් ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ දැනටමත් ලියාපදිංචි කොට ඇති භාර ලදුපත් බලාත්මකව පවතින කාලසීමාව පිළිබඳව සහ 2024 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව එම භාර ලදුපත් තවදුරටත් බලාත්මක කළ හැකි වීම සඳහා සහ ඒවායේ ප්‍රමුඛතාව තවදුරටත් බලපැවැත්වීම සඳහා එම භාර ලදුපත් එම පනත යටතේ ලියාපදිංචි කළ යුතු වීමේ අවශ්‍යතාවය පිළිබඳව විධිවිධාන සලස්වනු ලැබේ.

එල්.ඩී.-ඕ. 64/2017

## (86 වන අධිකාරය වූ) භාර ලදුපත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය*

1. (1) මේ පනත 2024 අංක     දරන භාර ලදුපත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

*86 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම*

**2.** (86 වන අධිකාරය වූ) භාර ලදුපත් ආඥාපනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "භාර ලදුපත විකුණුම් බිල් පත්‍රයක් ලෙස ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලබන අවස්ථාවක" යන වචන වෙනුවට "භාර ලදුපත විකුණුම් බිල් පත්‍රයක් ලෙස 2024 අංක     දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කරනු ලබන අවස්ථාවක" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද භාර ලදුපත්වලට අදාළ විධිවිධාන*

3. (1) නියමිත දිනයේ දී (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ විකුණුම් බිල් පත්‍රයක් ලෙස ලියාපදිංචි කරනු ලැබ ඇති භාර ලදුපතක් බලාත්මකව පවතින අවස්ථාවක දී, ඒ භාර ලදුපත නියමිත දිනයේ සිට අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා තවදුරටත් බලාත්මක විය යුතු නමුත්, ඒ අවුරුදු දෙකක කාලසීමාව ඉකුත් වීමට පෙරාතුව එම භාර ලදුපත විකුණුම් බිල් පත්‍රයක් ලෙස 2024 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ අදාළ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

PL 014319 - 475 (2024/01)

(2) (1) වන උපවගන්තියේ සඳහන් විකුණුම් බිල් පත්‍රයක් 2024 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ විට එය මුලින් ම නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි විකුණුම් බිල් පත්‍රයක් බවට පත් වූ දිනයේ සිට පරිපූර්ණත්වයට පත් වූ ලෙසට සලකනු ලැබිය යුතු අතර, එම විකුණුම් බිල් පත්‍රය මුලින් ම නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි විකුණුම් බිල් පත්‍රයක් බවට පත් වූ අවස්ථාවේ දී හිමිකම් ලැබුවේ යම් ප්‍රමුඛතාවකට ද ඒ ප්‍රමුඛතාව තවදුරටත් බලපැවැත්විය යුතු ය.

(3) නියමිත දිනයේ සිට අවුරුදු දෙකක් ඉකුත්වීමට පෙරාතුව 2024 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කරනු නොලබන (1) වන උපවගන්තියේ සඳහන් විකුණුම් බිල් පත්‍රයක් එම කාලසීමාව ඉකුත් වීමෙන් පසුව නීත්‍යානුකූලව බලාත්මක කළ නොහැකි විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී